

# පුරාවස්තු රැකගැනීම සඳහා පිළියම්

පුරාවස්තු යනු රටක අතීත සමාජවල මිනිසා විසින් පරිහරණය කළ හෝ නිර්මාණය කරන ලද හෝ වස්තුවල අවශේෂ වෙයි. පුරාවිද්‍යාව යනු එම අවශේෂ ආශ්‍රයෙන් සිදු කෙරෙන අධ්‍යයනය යි. එම අධ්‍යනය අද විශ්ව විද්‍යාල මට්ටමින් ද ඉතා දියුණු ආකාරයෙන් සිදුවෙමින් පවතී. පුරාවස්තු පිළිබඳ දැනුම මෙසේ විශ්ව විද්‍යාලවල පුරාවිද්‍යා විෂය ඉගෙන ගන්නා උපාධි අපේක්ෂක අපේක්ෂිකාවන්ට පමණක් ලබාදීමෙන් රටක පුරාවස්තු රැක ගත හැකි ද? එසේනම් පුරාවිද්‍යා විෂය සියළුම පාසල්වල දූදරුවන්ට ඉගැන්වීම කළ යුතු ද? අද මේ ප්‍රශ්නය ඇසීමට සිදුවී ඇත්තේ අපගේ පැරණි ජන උරුමය ඉතාමත් ඛේදනීය ආකාරයට ඉතාමත් භයානක උවදුරකට මුහුණ පා ඇති නිස යි. සැබැවින් ම අද විනාශයට බඳුන් වී ඇත්තේ පුරාවස්තු පමණක් ම නොවේ සමස්ත සමාජය තුළම සාරධර්ම පරිහානියක් අද දක්නට ලැබේ. මේ සාරධර්ම පරිහානිය අප රටට හෝ මේ යුගයට පමණක් සීමාවූවක් නොවේ. මීට වසර දෙදහස් තුන්සියයකට ඉහත භාරතීය ජන සමාජය තුළ ධර්මාශෝක වැනි ධාර්මික නරවරයෙකු රාජ්‍යය කළ කාලයේ දී පවා සමාජ පරිහානිය සාරධර්ම සෝද පාළුව තිබුණු බව අසෝක රජතුමා විසින් පිහිටුවන ලද ශිලා ලිපි වලින් ප්‍රකාශිත ධම්ම ලිපි වලින්ම පළ වන්නේ ය. එම නිසා අප රටේ අද සාරධර්ම පරිහානියට පත්වී ඇතැයි මැසිවිලි නැගීමෙන් පමණක් ඊට පිළියම් යෙදිය හැකි නොවේ. එසේනම් ඒ සඳහා කළයුත්තේ කුමක් ද? අප පාසල් විෂයයක් ලෙස පුරාවිද්‍යාව උගන්වනවා ද? පුරාවිද්‍යාව පාසල්වල ඉගැන්විය යුතුයැයි අපි නොකියමු. එහෙත් අපේ පුරාවස්තු හා අපේ පෞරාණික දේපල පිළිබඳ අවබෝධයක් නම් ළමා කාලයේදී ම අපේ දූ දරුවන්ට දිය යුතු ය. එය දිය යුත්තේ පාසල් අධ්‍යාපනයේ දී ද? නැත. අධ්‍යාපනයට පූර්ණයෙන් ඇති පෙරපාසල් අවදියේ දී ම මේ අප රටේ පෞරාණික අපේ ජාතික දේපල පිළිබඳ වූ ඒ සියළුම දේ ජන උරුමය ලෙසින් අප ඔවුන්ට පහදා දිය යුතුය. අද සිටින වැඩිහිටි ජනතාවට ඔවුන්ගේ පෙරපාසල් සමයේ දී ඒ අපේ ජන උරුමය අපගේ ජාතික වස්තුව පිළිබඳව අවබෝධයක් ලබා දුන්නා නම් මෙසේ බුදු පිළිම සිරසට හෝ බුදු පිළිම බඳට යකුල් පහරවල් එල්ල කරන්නේ නැත. දාගැබ් බිඳ විනාශ කරන්නේ නැත.

කුඩා කාලයේ දී පන්සල් වන්නේ හැඳුණු අඹ ගෙඩියක්, බෙලි ගෙඩියක් හෝ ජම්බු ගෙඩියක්වත් අපි නොකැවෙමු. ඊට හේතුව ඒවා සංඝයාවහන්සේලාට සාංඝික කර ඇති වස්තු නිසා ගිහියන් විසින් පරිභෝග කිරීම පාපයක් බව අපේ දෙමාපියන් හා වැඩිහිටියන් විසින් අපට කියා තිබූ නිසා ය. පෝයදට පන්සල් ගිය විට විහාරයෙහි ඇති අපාය පිළිබඳ සිතුවම් හෝ මූර්ති බැලීමට ද අපි ගියෙමු. එහි ලෝදිය හැළිය, අපායේ යමපල්ලන් හා තඩු අසන යම රජු ද අපට දක්නට ලැබුණි. බුදුරජාණන්වහන්සේට ගල් පෙරළූ දේවදත්ත ට සිදු වූ අපාගතවීම අපි දුටුවෙමු. එපමණක් ද නොව ගමේ ගොඩේ අපරාධකාරයකුට දේවදත්තයා යන නාමය ද පටබැඳි අයුරු අප අසා ඇත. කාලකන්නියා, පිංගුත්තරයා, වසවර්තියා ආදී මේ නාම සියල්ලම බුදුදහම හා ආශ්‍රිතව ගොඩනැගුණු ගමේ බණ මඩුවේ දී ඇසූ අපි පාපයට ලැජ්ජා බිය ඇතිව ඇති දැඩි වීමු. අද ගුවන්විදුලි බණ රූපවාහිනී බණ, පන්සල්වල බණ, ධර්ම සාකච්ඡා කොපමණ නම් තිබේ ද? ඒ කිසිවකින්වත් අපේ අතීත උරුමය හඳුන්වාදීම හෝ ඒවා විනාශ කිරීමේ ආදීනව කියා පහද දීමක් සිදු වෙනවා ද? දහම්පාසල්වල දහම් ඉගෙනීම කරනු ලැබේ. පාසල්වල ද බෞද්ධ සංස්කෘතිය පවා උසස් පෙළවල ශිෂ්‍ය ශිෂ්‍යාවෝ හදරති. අද පරිගණක භාවිතය පිළිබඳ රට පුරාම ටියුෂන් කඩවල පවා ඉගෙනීමේ ඉගැන්වීමේ කටයුතු ක්‍රියාත්මක වෙයි. අපේ ජන උරුමය ගැන කියා දීමට පාඩම් පොතක් මේ වන විටවත් පාසල් පංතිකාමරයට ලැබී තිබේ ද?

සාහිත්‍යයත් සිංහල භාෂාවත් අප රටේ ඉතිහාසයත් යන මේ විෂයයන් තුන ඉතා පුළුල් ලෙසින් සිංහල දෙමළ හා මුස්ලිම් යන ජාතීන් තුන සඳහා ම අවබෝධයක් ලබා දිය යුතුව ඇත. එවිට ළමා කාලයේ දී ම මේ රටේ ළමා පරපුර තුළ රට ගැන හා ඔවුනොවුන්ගේ අනන්‍යතාව පිළිබඳ අවබෝධයක් ලැබෙනු ඇත. එවිට ප්‍රභාකරන්ලා හෝ ඔවුන්ගේ ශ්‍රාවකයින්ට හෝ අනුගාමිකයින්ට සිංහල- දෙමළ- මුස්ලිම් ජාතීන් අතර ඛේද වැපිරීමට ඉඩක් ලැබෙන්නේ නැත. අපේ සත්‍ය ඉතිහාසය මේ ළමා පරපුරට ලබාදීම මුල් කර ගත් පොත හා පංති කාමරයට ලබාදීම වහාම කළ යුතුව ඇත. එය ඉතා දීර්ඝකාලීන කටයුත්තක් නොවිය යුතු ය. පොතපත ලිවීමත් සමගම ඒ සඳහා ගුරුවරුන් පුහුණු කරවීම ද කළ යුතුව ඇත. අප රටේ රාජධානි පිළිබඳව වුවද ඇතැම් දේශපාලනඥයින්ට පවා නිසි අවබෝධයක් නැති බව ඇතැම්විට ඔවුන් ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරන කරුණුවලින් පැහැදිලි වේ. මේ නිසා පාසල් දූදරුවන්ට පාසල් පොත පත මෙන් ම වැඩිහිටියන්ට ද ජනතාව අතර සමගිය පැතිරවීමේ ලොකු කාර්යභාරයක් ඉටු කළ හැකි දේශපාලඥයන්ට පමණක් නොව සාමාන්‍ය ජනතාවට ද අවබෝධයක් ලබා දීම පිණිස වන අපගේ ජාතික පුරාවස්තු පිළිබඳ අවබෝධයක් ලබා දෙන අතරේ අපගේ ජාතික

*අද ජනමාධ්‍යවල ද යුතුකමක් වන්නේ ඔවුන්ගේ විද්‍යුත් මාධ්‍යවලින් ගුවන් කාලයෙන් යටත්පිරිසෙයින් දිනකට පැයක්වත් මේ අප රටේ දේශීය උරුමය පිළිබඳ වැඩසටහන් ප්‍රචාරය කිරීම ජනමාධ්‍ය ප්‍රතිපත්තියක් ලෙසින් ප්‍රකාශයට පත් කර එය ක්‍රියාත්මක කළයුතුව ඇත. පුවත්පත් හා සඟරා අද ඇඳුම් පැළඳුම්, රූපලාවන්‍ය හා කෑමබීම සඳහා වෙන් වී ඇත.*

ඉතිහාසය නිවැරදිව පහද දීමේ පොතපත ලිවිය යුතුව ඇත. ඒ සඳහා අද දවසේ විශ්ව විද්‍යාලවලින් විශ්‍රාම ලබා සිටින ආචාර්යවරුන් ගේ හා මහාචාර්යවරුන් ගේ පූර්ණ සහාය ලබා ගත හැකිය. ඒ සඳහා ක්‍රියාත්මක වැඩසටහන් හා එය මෙහෙයවීමට සංවිධානාත්මක ව්‍යූහයක් පමණි අද අපට අවශ්‍ය වන්නේ. සමහරු දුටුගැමුණු රජතුමා, ගජබා රජතුමා, මහ විජයබාහු, මහා පරාක්‍රමබාහු ආදී රජවරුන් ගැන ළමා පරපුරට පහද දීමට මැලිවෙති. ඊට හේතුව සිංහල දෙමළ ජනවාර්ගික අර්බුදය තව තවත් වැඩිවීමට එය හේතුවක් වනවාලු. මෙයතම් තිවසේ වතුර භාජනයේ කිඹුලුන් දකින මායාවකි. අපගේ සත්‍ය ඉතිහාසය අපගේ ළමා පරපුරට වටහා නොදෙන අතරේ උතුරේ ප්‍රභාකරන් විසින් මේ ඉතිහාසය විකෘති කරමින් ඔවුන් ගේ කුඩා දරුවන්ට ඉගැන්වීමේ කටයුතු ඉතා සාර්ථක ලෙසින් කරගෙන යන බව රහසක් නොවේ. මෙය කාලාන්තරයක් තිස්සේ සිදුවෙමින් පවතින නොපෙනෙන ව්‍යසනයකි.

මේ සඳහා කළයුතු පිළියම නම් අපේ දකුණේ දෙමළ සිංහල මුස්ලිම් සුහදතාව රැක ගැනීමට නම් ඔවුනොවුන්ගේ අනන්‍යතාව නහවුරු වන අන්දමේ මේ දේශයේ ඉතිහාසය සත්‍ය ඉතිහාසය ක්‍රමානුකූලව හැදෑරීමේ අවස්ථාව ළමා පරපුරට ලබාදිය යුතු ය.

මේ කාර්යය අධ්‍යාපන අමාත්‍යංශයට පමණක් කළ හැකි කාරියක් නොවන්නේ ය. පැරණි දේ රැකීමට ඇප කැපවී සිටින රාජ්‍ය ආයතන වූ රාජ්‍ය ලේඛනාරක්ෂක, පුරාවිද්‍යා ජාතික කෞතුකාගාර හා සංස්කෘතික ත්‍රිකෝණය සංස්කෘතික කටයුතු ආදී දෙපාර්තමේන්තුවල ද බුද්ධශාසන හා ජනමාධ්‍ය අමාත්‍යංශවල පූර්ණ සහාය ද මේ සඳහා ලබා දිය යුතුව ඇත. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා තුනෙන් ම ලියැවුණු පොතපත පමණක් ම ප්‍රමාණවත් නොවේ.

අද ජනමාධ්‍යවල ද යුතුකමක් වන්නේ ඔවුන්ගේ විද්‍යුත් මාධ්‍යවලින් ගුවන් කාලයෙන් යටත්පිරිසෙයින් දිනකට පැයක්වත් මේ අප රටේ දේශීය උරුමය පිළිබඳ වැඩසටහන් ප්‍රචාරය කිරීම ජනමාධ්‍ය ප්‍රතිපත්තියක් ලෙසින් ප්‍රකාශයට පත් කර එය ක්‍රියාත්මක කළයුතුව ඇත. පුවත්පත් හා සඟරා අද ඇඳුම් පැළඳුම්, රූපලාවන්‍ය හා කෑමබීම සඳහා වෙන් වී ඇත. මේ සඳහා අද රූපවාහිනී හා ගුවන්විදුලි වැඩසටහන්වල ද ඉතා දැඩි නැඹුරුවක් ඇත. එහෙත් අපේ ජන උරුමය පහදදීමට මෙයින් විනාඩි කීපයක්වත් වැය කිරීමට ඔවුන් උත්සාහ නොගන්නේ ඇයි.

භාරත දේශයේ රාමායනය, මහා භාරතය වැනි මහා කාව්‍යන් අද චිත්‍රපටවලට නංවා ඔවුන්ගේ ජනතාවට පමණක් නොව විදේශීය ජනතාවට පවා රසවිඳීමේ අවස්ථාව උදාකර දී ඇත. ඒ තත්ත්වය අනුව අප සිටින්නේ කොතැනදැයි විමසා බැලීමට අද කාලය පැමිණ ඇත.

මෙතෙක් සඳහන් කළ කාර්යයන් දිගුකාලීනව කළ යුතු ඒවා ය. කෙටිකාලීනව කළ යුතු වේ නම් පුරාවස්තු හොරුන්ට හා විනාශ කරන්නන්ට එරෙහිව දැඩි දඬුවම් ලබා දීම යි. ❑



ත්‍රස්තවාදී ප්‍රහාරයට ලක් වූ දළදා මාලිගය

# ආදි අනුරාධපුර සමය

දඹදිව අශොකරජ්ජුගෙ කාලෙ වනවිට උතුරුබාරතෙන් ආපු ආරියබාසාවක් කතාකළ සිංහලජනයා මේ දිවයිනේ නොයෙක් පෙදෙස්වල ජනාවාස පිහිටුවගත තමන්ගෙ දිවිපෙවෙතට උවමනා වී ගොවිතැනෙන් ගවයන් ඇතිකිරීමෙන් අත්කම් ආදියෙන් පුහුණුව ඇතිකරගෙන වෙළඳමෙන් සෑහෙන තරමකට යෙදිල රටේ පාලනයට උවමනා සංවිදනත් ඇතිකරගෙන හිටිය. මේ ආරිය ජනාවාසවලින් උතුරු පෙදෙසේ අනුරාදපුරයත දකුණේ දිගාවැවත් අතික්වාට වැඩියෙන් දියුණුව තිබුණ.


මිහිඳුරහතුන්නාන්සේ සිංහලේට පැමිණෙන්න ටිකකලකට ඉස්සර වෙල ඒ කාලෙදි මේ දිවයිනේ අනුරාදපුරේ අදිපති වෙලා හිටිය තිස්සනරපතියා අසොකසක්විත්තන්ට පඩුරු දීල දූතයන් යැව්ව. ඒ පඩුරු ලැබිල පැහැදුණු අසොකනරනාතයා තිස්සට රාජාබිසේකයට උවමනා සියලු උපකරණ ඇතුළුව පිළිපඩුරු එව්ව. ඒ උපකරණවලින් තිස්ස රාජාබිසේක ලැබුව. තිස්ස රජ්ජුට ඉස්සර මේ රටේ අබිසෙස් ලත් රජ්ජුන් නැහැ කියල පැහැදිලිව ම කියල තියෙනව. පුරාණ සිංහල රජ්ජුන් අතර බාවිතාවේ පැවති ගාමයේ (සමූහයේ) නායකයා යන අරුත ඇති ගාමණී (සකු - ග්‍රාමණී: එළු-ගැමුණු ) යන අබිදනෙනුත් මේ බව ඔප්පු වෙනව. දෙවිවරුන්ගෙ යාළුවා යන අරුත ඇති දෙවානම්පිය (දෙවනපෑ) යන අබිදනෙ තිස්ස රජ්ජුගෙ නමට පෙරටුව යෙදිල තියෙනව වංසකතාවල. මේ අබිදනෙනුයි අසොකනරාදිපයින් තමනුත් තමන්ට පෙර හිටිය මගදරජ්ජුනුත් තමන්ගෙ සාසනවල සඳහන් කරල ඇත්තෙ. අසොකරජ්ජුට පසුව මගදරජව හිටිය එයාගෙ මුනුබුරා දසරතත් මේ අබිදානෙ බාවිතා කරල තියෙනව. මොරිය රජ පෙළපත නැතිවුණායින් පස්සෙ බාරතෙ රජ්ජුන් අතර බාවිතාවෙන් ගිලිහිල ගිය මේ අබිදනෙ දෙවානම්පියතිස්ස රජ්ජුට පසුවත් දෙසිය අවුරුද්දක් පමණ යනතුරු සිංහල රජ්ජුන් අතර බාවිතා වුනා. මගදරාජ්ජේ අනුව යමින් සිංහලරාජ්ජේ පිහිටවපු බව මෙයින් එළිවෙනව.

බුදුන් දහම් සඟ යන තුනුරුවන සරණ ගොහින් උපාසකයෙක් වෙල තමා සිටින බව පවසල තිස්සත් එහෙම කළොත් හොඳයි කියන සන්දේසෙකුත් අසොක මහීපාලයා සිංහල නිරිඳුන්ට එව්ව. මේ ආකාරයෙන් මිහිඳුරහතුන්නාන්සෙගෙ සිංහලගමන සපල වෙන්නට උවමනා කරුණු සැලසුණාට පස්සෙ යි උන්වහන්සෙ පොසොන් පුර පසළොස්වක් දවසක මිහින්තලේට වැඩල තිස්සරජ්ජු හමුවුනෙ. සිංහලරජ්ජුත් ඇමතිවරුත් මහජනයාත් බාරතෙන් ආ තෙරුන්වහන්සේ හරසරින් පිළි අරගෙන උන්වහන්සේ දෙසූ දහමෙ හොඳට ම පැහැදුන. මිහිඳුරහතුන්නාන්සෙටත් උන්වහන්සෙ සමඟ ආ අනිත් තෙරුන්ටත් උන්වහන්සේලා දෙසූ දහම් අහල සිංහලරාජ්ජේ පැවිදි වෙලා හිටිය අයටත් වාසයට විහාර පිහිටෙවුව. අනුරාදපුරෙත් මිහින්තලෙත් සැදැහවතුන්ට වැඳුම් පිදුම් කරගැනීමට දාගැබක් බුදුන් ගෙ දකුණු අකුදතුව නිදන් කරල අනුරාදපුරේ පවුරෙන් පිට තැනෙව්ව. බුද්දගයාවේ බුදුන් පිටදුන් බෝදියෙ සාකාවක් ගෙනත් අනුරාදපුරයට දකුණෙන් තිබුණු රජමාළිගාවත්තෙ හිටෙවුවා.මිහිඳු මාහිමියන්ගෙ සොහොයුරී සංඝමිත්තාතේරියි මේ බෝදිසාකාව වැඩමවාගෙන ආවෙ. ඒ තෙරණියෝ ගැහැනුන් පැවිදි කරවල මෙහෙණිසස්නත් මේ රටේ ඇති කළා. ථූපයත් බෝදියත් බුදුන් සිහි කරවන නිමිති හැටියට සැලකුව. එයින් එකකට වැඳීමෙනු යි ආදි කාලෙයෙ සැදැහැවතුන් මුනිඳුන්ට බැතිය පළ කෙළේ. සිංහල ජනයා මේ දිවයිනේ පදිංචි වූ අයුරුත් බුදුදහම තමන්ගෙ සමය හැටියට පිළිගත් හැටිත් පොත්පත්වල එන කතාවලින් වටහ ගන්න පුලුවන් මෙහෙම යි. මේ තොරතුරු බොහෝ සෙයින් මේ විදිහට පුරාවස්තුවලිනුත් එළි වෙනව.


(මහාචාර්ය සෙනරත් පරනවිතාන සූරීන්ගේ "සිංහලයෝ" කෘතියෙනි.)

(එම පොතේ ලියා තිබූ ආකාරයෙන්ම පළකර ඇති බව කාරුණිකව සැලකුව මැනවි)


# උතුරු නැගෙනහිර පුරාවස්තු



වවුනියා දිස්ත්‍රික්කයේ,
1. සමලන්කුලමේ පිහිටි පිළිම ගෙයක් කැණීමේ දී හමු වූ අවලෝකිතේශ්වර බෝධිසත්ව රූපය පිරිසිදු කර තහවුරු කරන්නට ප්‍රථම
2. නෙළුක්කුලම ස්ථානයේ පැරණි දගැබ කැණ පාද ඇති අයුරු.
3. එම දගැබේ පැරණි ගඩොල් ගෙන නිවසක් සාද ඇති අයුරු.
4. නෙළුක්කුලමේ පැරණි දගැබ් මළුවේ බැම් පාද ඇති ඇයුරු




ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කුච්චවේලියේ,
1. පැරණි බෞද්ධාරාමයක පුරාවිද්‍යා කැණීම් කරගෙන යන අයුරු
2. එහි දී හමු වූ හිටි බුදුපිළිම කොටස්
3. පැරණි බෞද්ධාරාමයක නටබුන් සහ අසල ගොඩනැගෙන අලුත් කෝවිල
4. කැණීමේ දී හමු වූ බුදුපිළිම හිසක් සහ කැඩුණු කොටස්



1. සෙම්බුමලේ දගැබ දැන් කන්දක ආකාරයෙන් දිස් වේ.
2. කුච්චවේලි හි පිහිටි ශිලාලිපිය.
3. කුච්චවේලි හි තිබියදී ගල්කටුවකින් ගසා විනාශ කිරීමට ගොස් තිබුණු චෛත්‍යය.
4. ඉර හඳ පවතින තාක් මේ සිද්ධස්ථාන පවතීවා යි සඳහන් ශිලා ලේඛන.



1. වවුනියා දිස්ත්‍රික්කයේ එක් පැරණි ස්ථානයක ඇති ගල් කරඬුවක්
2. මන්නාරම් දිස්ත්‍රික්කයේ තිරුකේතීශ්වරම් කැණීමෙන් ලැබුණු වලං කැබලි.
3. පැරණි මාතොට නටබුන් මත පිහිටි තිරුකේතීශ්වරම් කෝවිල
4. යාපනයේ කන්තරෝඩය ස්ථානයේ පැරණි කදුරුගොඩ විහාර භූමියේ තිබී හමු වූ කඩා දමන ලද බුදුපිළිමයක කොටසක්



1. යාපනය දිස්ත්‍රික්කයේ නීලාවරීයේ පිහිටි දගැබක අවශේෂ.
2. සෙම්බුමලේ නටබුන් වෙහෙරට යාමට ගල්කුලේ කොටා ඇති පඩි පේළිය.
3. ඇදගෙන ගොස් ඇති පිළිමවහන්සේ ගෙන් කැඩී බිඳී ගිය කොටස්.
4. වෙහෙර හාරා පුරාවස්තු ගෙන ඇත.